

# ශුද්ධාත්මය බලයක්ද පුද්ගලයෙක්ද?

(The Holy Spirit Power or Person ?)

# ශුද්ධාත්මය බලයක්ද පුද්ගලයෙක්ද?

- මයික් මූල් විසිනි -

# පටුන


| | |
|---|---|
| අභිරහසක් නොවේ | 3 |
| දෙවියන්වහන්සේගේ ආත්මය | 4 |
| දෙවියන්වහන්සේගේ අසීමිත බලය | 5 |
| බලය සහ ආත්මය | 6 |
| ආත්මය යනු කුමක්ද? | 7 |
| ශුද්ධාත්මය ගැන සහා උගැන්වීම් | 9 |
| 1. "ස්ප්‍රිතු සාන්තුවහන්සේ" (THE HOLY GHOST) | 9 |
| 2. "ශුද්ධාත්මය" හැඟවීමට ඉංග්‍රීසියේ කැපිටල් S අක්ෂරය | 10 |
| 3. "ඔහු" (උන්වහන්සේ) සහ "කවුද" | 10 |
| 4. ශුද්ධාත්මය ශෝක කිරීම. | 10 |
| 5. එපිසයේ වැඩිමහල්ලෝ | 11 |
| 6. "දෙවියන්වහන්සේගෙන් එවන ලද" | 12 |
| 7. "සැනසිලිකාරයාණන්වහන්සේ" | 13 |
| "ශුද්ධාත්මයේ දීමනා" | 14 |
| ශුද්ධාත්මය ඇති බව පමණක් ගැලවීමේ සහතිකයක්ද? | 16 |
| ගැලවීම ලැබීමට අප කුමක් කල යුතුද? | 17 |
| අවසානය | 18 |
| ප්‍රශ්න | 19 |

# <u>ශුද්ධාත්මය</u>
# <u>බලයක්ද පුද්ගලයෙක්ද?</u>

- මයික් බූල් විසිනි -

බයිබලය කියැවූ සහ ක්‍රිස්තියානි ගුරුවරුන්ට සවන් දුන් බොහෝ මිනිසුන් සහ ස්ත්‍රීන් ශුද්ධාත්මයත් අරබයා ගැටලුවකට පත්වී ඇත. ශුද්ධාත්මය යනු කවුද නැතහොත් කුමක්ද? ශුද්ධාත්මය දෙවිකෙනෙක්ද නැතිනම් දෙවිකෙනෙකුගේ කොටසක්ද? සත්‍යය කුමක්ද?

මෙම ප්‍රශ්න වලට පිළිතුරු දීම සඳහා, එකම අධිකාරිය වන බයිබලය දෙසට අපි හැරෙමු. ශුද්ධාත්මය පිළිබඳව සත්‍යය ඔබට ස්ථිරකර ගැනීමට මෙම පොත් පිංචෙහි සඳහන් කරන ලද බයිබල් කොටස් දෙස කරුණාකර හැරෙන්න.

## <u>අභිරහසක් නොවේ.</u>

ශුද්ධාත්මය පිළිබඳව ප්‍රශ්න කිරීමේදී අද බොහෝ ආගමික ගුරුවරුන් එය අභිරහසක් ලෙසට පිළිතුරු දෙන අතර එහි අර්ථය තේරුම් ගැනීමට අප බලාපොරොත්තු නොවිය යුතුයැයි පවසත්. තර්කානුකූල විස්තර කිරීමක් අනවශ්‍යව, "විශ්වාසයෙන්" ඔවුන්ගේ විස්තර කිරීම් පිළිගත යුතු යැයි ඔවුහු නිතරම පවසත්.

මෙය නිදහසට කාරණයක් නොවේ. මෙවැනි විස්තර කිරීම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ක්‍රියාව තුළින් දෙවියන්වහන්සේගේ අභිරහස දැනටමත් එළිදරව් වී ඇති බැව් පෙන්වන බයිබල් පද නොසලකා හරී.

"තමන්වහන්සේ තුළ අදහස් කළ තමුන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තත් <u>රහස</u> අපට දන්වා දීමෙන්ය" (එපීස 1:10)

"අනාගතවක්තෘවරුන්ගේ ලියවිලිවලින් ප්‍රකාශ කරන ලදුව .......... සියලු ජාතීන්ට ........ ඒ <u>රහස</u> එළිදරව් වීමේ හැටියට" (රෝම 16:25-26)

"දෙවියන්වහන්සේගේ ශුද්ධවන්තයන්ට ප්‍රකාශ වුනාවූ <u>රහස</u> ................" (කොලොස්සි 1:25)

ආගමේ "අභිරහස්" දැන් එළිදරව් වී ඇති බැව් පෙන්වන බයිබල් පාඨ

ඇත්තේ මෙපමණක් නොවේ. (රෝම 11:25, එපිස 3:3, 6:19, කොලොස්සි 4:3, 1 කොරින්ති 15:51 ද බලන්න.) සුභාරංචි වල මූලික ඉගැන්වීම් තුළ "අභිරහසක්" දැන් නොමැති බැව් බයිබලය පුන පුනා කියන්නේ නම්, අප එය කියවා සොයන්නේ නම්, බයිබලය තුළ ශුද්ධාත්මය පිලිබඳ සත්‍ය සොයා ගත හැකි බැව් අපට විශ්වාස කල හැක.

"මෙය අභිරහසකි. එම නිසා එය තේරුම් ගැනීමට උත්සහ නොකරනැයි" යේසුස්වහන්සේ හෝ කිසිම ගෝලයකු කීවේ නැත. ඒ වෙනුවට ඔවුන් බයිබලයේ දේවල් ඔවුන්ගේ සවන්දෙන්නන් හට පෙන්වන්නට වෙහෙස දැරීය."

## දෙවියන්වහන්සේගේ ආත්මය

"ආත්මය" නමැති වචනය "දෙවියන්වහන්සේගේ ආත්මය" යනුවෙන් බයිබලය පුරා බොහෝ වාරවල් සඳහන්ව ඇත. දෙවියන්වහන්සේ පෘතුවිය මත සියල්ල මැවීමට සූදානම්ව සිටියෙදී "දෙවියන්වහන්සේගේ ආත්මය" ජලමතුයෙහි හැසිරෙමින් සිටිසේකැයි බයිබලය මුල් ආරම්භයේදීම පවසයි. (උත්පත්ති 1:2)

බයිබලය තුළ සඳහන්වන ආත්මය දෙවියන් වහන්සේගේය. උන්වහන්සේ තුළින් එන්නාවූ සහ උන්වහන්සේ සතුව පවතින්නාවූ ඒ යම්දෙය දෙවියන්වහන්සේගේ ආත්මයයි. බයිබලය තුළ බොහෝ වාර ගණනාවක් "දෙවියන්වහන්සේගේ ආත්මය" නමැති පදය දිස්වන්නේ එනිසාය. (උදාහරණයක් වශයෙන් යෙසායා 11:2, 40:7, 61:1, මීකා 3:8)

උන්වහන්සේ ගැන බොහෝ දේ දෙවියන්වහන්සේගේ ආත්මය සම්පිණ්ඩනය කරයි. "ආත්මය" යනුවෙන් බයිබලයේ පැරණි ගිවිසුමේ පරිවර්තන කරන ලද වචනය (රූඅක්), මූලිකව "හුස්ම" හෝ "බලය" හඳුන්වයි. එම නිසා උන්වහන්සේගේ මනස පිළිබිඹු කරන, දෙවියන්වහන්සේගේ මුලු සාරයවන දෙවියන්වහන්සේගේ ආත්මය උන්වහන්සේගේ "ශ්වසනයයි."

මනුෂයන් වන අප මෙන්ම, දෙවියන්වහන්සේගේ ක්‍රියා උන්වහන්සේගේ සිතුවිලි පිලිබිඹු කරත්. මනුෂයාගේ ආත්මය ඔහු කෙබන්දෙක්දැයි බයිබලය පෙන්වයි. අපි යමක් ගැන සිතා එය කරන්නෙමු. උදාහරණයක් ලෙස, අපගේ "ආත්මය" හෝ මනස අපගේ කුසෙහි බඩගින්නට ප්‍රතික්‍රියා දක්වන අතර, අපි යම් ආහාරයක් සොයන්නෙමු. ආත්මයට ඇති මෙම හෙබ්‍රෑව් වචනය හුස්ම, මනස සහ බලය යන සියලු වචනවල අරුත් හඟවන්නේ ඇයි දැයි මෙය තේරුම් කරයි. මූලික අපවන අපගේ ආත්මය අපගේ සිතුවිලි සඳහන් කරන

අතර, එම නිසා අපගේ මනසේ නැඹුරුව හෝ සිතුවිලි පිලිබිඹු වන ක්‍රියාද සඳහන් කරයි.

අතිමහත් මහිමාන්විත පරිමාණයකින් දෙවියන්වහන්සේගේ ආත්මයද එසේය. උන්වහන්සේගේ මූලික ස්වභාවය, උන්වහන්සේගේ චරිතය සහ අභිප්‍රාය විදහාපාන්නේ එහි බලයෙනි. දෙවියන්වහන්සේ සිතන නිසා උන්වහන්සේ ක්‍රියා කරන සේක.

**"මා යෝජනා කල ලෙසට සිදුවන්නේය. මා අදහස් කල ලෙසට ස්ථිර වන්නේය." (යෙසායා 14:24)**

## දෙවියන්වහන්සේගේ අසීමිත බලය

දෙවියන්වහන්සේ සර්වබලධාරිය. උන්වහන්සේ ලෝකයේ මැවුම්කරුවාණෝය. යුගයයන් තුළ වන්දනා කරන ලද දෙවිවරුන් යැයි අදහස් කල අනෙක් අයට අසමානත්වයෙන්, බයිබලයේ දෙවියන්වහන්සේ එකම සත්‍යය දෙවියන්වහන්සේය.

**"ස්වාමින්වහන්සේ සැබෑවූ දෙවියන්වහන්සේය. උන්වහන්සේ ජීවමාන දෙවියන්වහන්සේය. සදාකාල රජකෙනෙක්ය...... උන්වහන්සේ තමන්ගේ බලයෙන් පොළව සෑදූ සේක. තමන්ගේ ප්‍රඥාවෙන් ලෝකය පිහිටුවා......" (යෙරමියා 10:10-12)**

ලෝකයත් එහි අඩංගු සියල්ලත් මැවූ විට, මුල් ආරම්භයේදීම දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ බලය භාවිතා කළ සේක. මිනිසුන් සහ සත්වයන් මැවීම සඳහා පාවිච්චි කරන ලද මෙම බලයම තුළින් දෙවියන්වහන්සේ ලෝකය පාලනය නොකඩවා කරගෙන යන සේක.

**"මෙම මාගේ මහත් බලයෙන්ද දිගුකල මාගේ හස්තයෙන්ද පොළව සහ පොළව මතුපිට මනුෂ්‍යයාත් තිරිසනාත් මැවුවෙමි. මට හරිව පෙනෙන ලෙස මම කැමති අයට එය දෙමි." (යෙරමියා 27:5)**

දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ස්වභාවයෙන්ම බලසම්පන්න නිසා, උන්වහන්සේගේ ආත්මයද බලසම්පන්නය. මනුෂ්‍යයන් වූ අපටත් යම් බලයක් ඇතිවුත්, ඇත්තවශයෙන්ම එය සීමා සහිතය. අපට ඇත්තේ අප ආශාකරන ක්‍රියා සමහරක් කිරීමට පමණක් බලයකි.

අපට නොමැති හැකියාවක් දෙවියන්වහන්සේට ඇත. උන්වහන්සේට තම බලය මනුෂ්‍යයන්ට දිය හැක.

"උන්වහන්සේ ක්ලාන්තවූ අයට ශක්තිය දෙන සේක. බලය නැත්තාට සවිය වැඩි කරන සේක." (යෙසයා 40:29)

සමහර අවස්ථාවලදී , මෙම බලයේ කුසලතාවයට ආත්මය යැයි කියනු ලැබේ.

## බලය සහ ආත්මය

උන්වහන්සේ දිවැසිවරයෙකුට දෙන ලද දෙවියන් වහන්සේගේ බලය හෝ ආත්මය ගැන පහත දැක්වෙන පරිදි පවසා ඇත.

"........ ස්වාමීන්වහන්සේගේ ආත්මය ඇතුව, බලයෙන්ද යුක්තියෙන්ද ධෛර්යයෙන්ද පූර්ණව සිටිමි." (මීකා 3:8)

දෙවියන්වහන්සේගේ වචනය ප්‍රකාශ කිරීමේදී දිවැස්වර මීකා හට ආත්මය බලය ලබාදුනි. දෙවියන්වහන්සේ තමන් සමඟ සිටි බැව් ජනතාවට සලකුණු පෙන්වීමට හෝ විවිධ ප්‍රාතිහාර්ය කිරීමට බයිබලයේ තවත් බොහෝ අයහට බලය ලැබුණි.

මේ සියල්ලටම වඩා උදාරව, යහපත් දෑ කිරීමට දෙවියන්වහන්සේගේ බලය, ශුද්ධාත්මය, යේසුස්වහන්සේට ලැබුනි.

"දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරිය යේසුස්වහන්සේ ආලේප කල බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩා කරන සියල්ලන් සුව කරමින් හැසුරුනු බවත්ය." (ක්‍රියා 10:38)

මෙම බලය දෙවියන්වහන්සේ තම පුත්‍රයාවන යේසුස් ක්‍රිස්තුස්වහන්සේට දෙන ලද දීමනාවක් විය. එම බලය ශුද්ධාත්මය විය.

ඉහත සඳහන් උද්ධෘතය යේසුස්වහන්සේ ශුද්ධාත්මයෙන් අභිෂේක කරන ලද බැව් පවසයි. බයිබලයේ කලින්, යේසුස්වහන්සේ හට ශුද්ධාත්මය දානය කරන ලද වේලාව විස්තර කරයි. මේ යේසුස්වහන්සේ දේශනා කරන්නට ආරම්භ කිරීමට මොහොතකට කලිනි. යොහාන් බෞතිස්ත උන්වහන්සේ යොර්දාන් නදියේ බෞතිස්ම කළේය. පසුව ක්ෂණිකව, පහත සඳහන් වදන් තුළින් දෙවියන්වහන්සේ ආමන්ත්‍රණය කළ අතර ශුද්ධාත්මය යේසුස්වහන්සේ මත පැමිණියේය.

"නුඹ මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. නුඹ කෙරෙහි ඉතා ප්‍රසන්නව සිටිමි."
(ලූක් 3:21-22 බලන්න.)

මෙයට ප්‍රථම පවා ශුද්ධාත්මයේ බලය යේසුස් වහන්සේගේ ජිවිතයේ ක්‍රියා කරමින් තිබුණි. උන්වහන්සේ උපදින්නට ප්‍රථම, උන්වහන්සේගේ මව වන මරියා හට දෙවියන්වහන්සේගේ දූතයෙක් දර්ශණය විය. දෙවියන් වහන්සේගේ පුත්‍රයා යැයි හඳුන්වනු ලබන විශේෂ පුත්‍රයෙකු ඇය ලබන බැව් දේවදූතයා ඇයට කිය. තමන් කන්‍යාවක් බැවින් මෙය කෙසේ සිදුවන්නේද,යි මරියා විමසූ විට දේවදූතයා පැවසුවේ :

> "ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹ කෙරෙහි පැමිණෙන සේක. මහෝත්තමයාණන්ගේ ආනුභාවයද නුඹ වසාගන්නේය. ඒ නිසා උපදින්ට සිටින තැනැත්තේ ශුද්ධය දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝයයි කියනු ලබන සේක." (ලූක් 1:35)

යේසුස්වහන්සේගේ උත්පත්තියේ ප්‍රාතිහාර්යය, ශුද්ධාත්මය යැයිද එළිදරව් කරන ලද, මෙම පදයේදී "මහෝත්තමයාණන්ගේ ආනුභාවයෙන්" යැයි හඳුන්වන දෙවියන්වහන්සේගේ බලයෙන් සිදුකරන ලදී.

බයිබලයේ කොතැනකවත් යේසුස්වහන්සේ "ශුද්ධාත්මයේ පුත්‍රයා" යැයි හඳුන්වන්නේ නැති අතර උන්වහන්සේ "මනුෂ්‍ය පුත්‍රයාණෝ" (මරියා මගින්) හෝ "දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෝ" ලෙස පමණක් හඳුන්වන්නේ උන්වහන්සේගේ උත්පත්තියේ විශ්මය දෙවියන්වහන්ස්ගේ ශුද්ධාත්මය විසින් සිදුකල බැවිනි. පුත්‍රයෙකුගේ උපත දෙවියන්වහන්සේගේ අභිලාෂය විය. එම නිසා උන්වහන්සේ තමන්වහන්සේගේ ශුද්ධාත්මය මගින් එය ක්‍රියාවට නැංවිය.

## ආත්මය යනු කුමක්ද?

අප කියූ පරිදි "ආත්මය" යනු දෙවියන්වහන්සේගේ බලයට වඩා වැඩි යමක් වෙයි. මනුෂයෙන්ගේ පෙනහලු තුළ ඇති වාතය ඔවුන්ගේ කොටසක් වන ලෙස එය දෙවියන්වහන්සේගේ කොටසක් වන්නේය.

යේසුස්වහන්සේ මෙසේ තේරුම් කළසේක :

> "දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේට නමස්කාර කරන්නන් විසින් ආත්මයෙන්ද සැබෑ කමෙන්ද නමස්කාර කල යුතුය." (යොහන් 4:24)

බයිබලය තුළ ආත්මය, දෙවියන්වහන්සේගේ මනසටත් උන්වහන්සේගේ සිතුවිලි වලටත් සම්බන්ද අතර උන්වහන්සේගෙන් නික්මෙන්නාවූ වචන වලටද සම්බන්දය.

"ස්වාමින්වහන්සේගේ ආත්මයට මග පෙන්නුවේත් උන්වහන්සේගේ මන්ත්‍රීව සිට උන්වහන්සේට ඉගැන්නුවේත් කවුද?" (යෙසායා 40:13)

පසුව අලුත් ගිවිසුමේ අපොස්තුලු පාවුල් පහත සඳහන් ලෙස මෙම වදන් උද්ධෘත කළේය :

"ස්වාමින්වහන්සේගේ සිත දැන් ගත්තේ කවුද? නොහොත් උන්වහන්සේට මන්ත්‍රීයා වූයේ කවුද?" (රෝම 11:34)

දෙවියන්වහන්සේගේ මනසට සහ උන්වහන්සේගේ වචන වලට මහා බලයක් ඇත. උන්වහන්සේ යමක් කිරීමට සිතින් යෝජනා කිරීම සහ උන්වහන්සේගේ මුඛයේ වචනද, සැමවිටම ඉටුවන්නේය. පටන්ගැන්මේදී, "එලිය වේවයි" දෙවියන්වහන්සේ ප්‍රකාශ කළ සේක. (උත්පත්ති 1:3) දෙවියන්වහන්සේ මෙය කෙසේ ඉෂ්ඨ කරන්නේදැයි අප නොදන්නා නමුත්, කළදේ අපට බැලීමට පුලුවන. ආබ්‍රහම්ගේ පුත් ඊසාක් සහ ඔහුගේ භාර්යාව රෙබෙක්කා, ඔවුන්ගේ පුත් ඒසවු ඔවුන් අනුමත නොකල දේ කර කණගාටු වූ විට, "මනස" යන අර්ථයෙන් එම හෙබ්‍රෙව් වචනම (රුඅක්) "ආත්මය" හෝ "හුස්ම" බයිබලය භාවිතා කරයි.

"ඔවුහු ඊසාක්ද රෙබෙකාටද ශෝක හේතුවක් වූහ." (උත්පත්ති 26:35)

නැවත වරක්, පැරණි ගිවිසුමේ "ආත්මය" , "හුස්ම" හෝ "සුලඟ" ලෙස සාමාන්‍යයෙන් පරිවර්තනය කර ඇත්තේ "මනස" නමැති එම හෙබ්‍රෙව් වචනමය. (රුඅක්).

දෙවියන්වහන්සේ කතා කිරීම සහ උන්වහන්සේගේ ආත්මය අතර සබඳතාවයක්ද බයිබලය තුළ ඇත. දෙවියන්වහන්සේ කතාකරන විට, එය සිදුවේ. උන්වහන්සේගේ වචන බලසම්පන්නය.

"ස්වාමින්ගේ වචනයෙන් ආකාශයද උන්වහන්සේගේ මුඛයේ හුස්මෙන් එහි සියලු සේනාවද මවන ලද්දේය...... උන්වහන්සේ කථා කල පමණින් ඉෂ්ඨ විය." (ගීතාවලි 33:6,9)

ඉහත "හුස්ම" යනුවෙන් ඇති වචනය, මුල් භාෂාවේ "ආත්මය" යනුවෙන් නිතරම පරිවර්ර්තනය කර ඇති එම වචනයමය. දෙවියන්වහන්සේගේ වචනවලට බලය ඇති අතර උන්වහන්සේ ප්‍රකාශ කරනදේ ඉටුවන්නේය.

අප කලින් දුටු පරිදි "සුලඟ" හෝ "පවන" , එසේම "හුස්ම" යන්නට

එම වචනයමද සම්බන්ධය. ආදම් සහ ඒවට දෙවියන්වහන්සේගේ කටහඬ "දිවාභාගයේ සිසිල්වේලේ" ඇසුනු බැව් බයිබලය පවසයි. (උත්පත්ති 3:8) නැවත වරක් "සිසිල්" යන වචනය මුල් ආකෘතියෙහි "ආත්මය" යන වචනයට සමානය. එය උයන හරහා සුලඟක් හෝ පවනක් හමා යන වේලාව විය. දෙවියන්වහන්සේගේ ආත්මය සුලඟට සමානය. අපට එය බලන්නට නොහැකි වුවත් එහි ප්‍රතිපල අපට බැලිය හැක. අපට සුලඟ නොපෙනුනත් සුලඟ ගස් අතරින් හමා යන විට පත්‍ර සෙලවෙන සැටි අප පෙනේ. දෙවියන්වහන්සේ පෘතුවිය තුළ ක්‍රියාකරන අතර, උන්වහන්සේ සිදු කරන දේවලින් උන්වහන්සේගේ බලය අපට පෙනේ.

බයිබල් පාඨ බොහෝ ගණනක් ආත්මය යන්නට යොදා ඇති වචනය "හුස්ම" හෝ "සුලඟ" යනුවෙන් පරිවර්තනය කර ඇත. (උදාහරණ ලෙස උත්පත්ති 7:15, නික්මයාම 10:13,19 ගණන් කථාව 11:31, 2 සාමුවෙල් 22:16, 1 රාජාවලිය 18:45, 19:11, යොබ් 4:9)

## <u>ශුද්ධාත්මය ගැන සභා උගැන්වීම්</u>

වර්තමානයේ බොහෝ ක්‍රිස්තියානි සභා නායකයෝ, ශුද්ධාත්මය පුද්ගලයකු බවත් ත්‍රිත්වය යැයි ඔවුන් හඳුන්වන්නෙහි එක් තැනන්වහන්සේ නමක්-පියාණන්, පුත්‍රයාණන් සහ ශුද්ධාත්මයාණන්ගෙන් සමන්විත වන බවත් පවසත්. මෙය බයිබලයේ හමුවන දෙයක් නොවන අතර ක්‍රිස්තුස්වහන්සේට වසර 300කට පසු පමණක් සභාවට හඳුන්වාදුන් ඉගැන්වීමක් වෙයි.

මෙම ඉගැන්වීම සත්‍ය නම් දෙවියන්වහන්සේගේ වචනය වන බයිබලයේ එය පැහැදිලිව උගන්වා ඇති බැව් අපට හමුවිය යුතුය. බයිබලය අපගේ එකම අධිකාරිය විය යුතුය.

"ත්‍රිත්වය" හෝ "ශුද්ධාත්මයාණන් වන දෙවියන් වහන්සේ " යන පද බයිබලයේ කොතැනකවත් හමු නොවන මුත්, මෙම උගැන්වීමට සහාය වීමට ගන්නා ලද සමහර පද ඇත. අපගේ නිරීක්ෂණය සඳහා මෙයින් සමහරක් පරීක්ෂා කර බලමු.

## (1) <u>"ස්ප්‍රිතු සාන්තුවහන්සේ" (THE HOLY GHOST)</u>

ජේම්ස් රජතුමාගේ බයිබල් සංස්කරණයේ ශුද්ධාත්මයන් සමහර විට "ස්ප්‍රිතුසාන්තු" ලෙස හඳුන්වනු ලබයි. සාන්තුවරයකු ඇත්තටම පුද්ගලයෙකු නොවන්නේද? ඇත්තටම මෙය පැරණි කරන ලද ඉංග්‍රීසියේ යෙදුමකි. කිසිම නූතන බයිබලයක මේ පරිවර්තනය නැත.

## (2) "ශුද්ධාත්මය" හැඟවීමට ඉංග්‍රීසියේ කැපිටල් S අක්ෂරය.

ශුද්ධාත්මය වචනයට (SPIRIT) ඉංග්‍රීසි බයිබල් තුළ නිතරම කැපිටල් S අක්ෂරය පාවිච්චි කිරීම තවත් පොදු වැරදි වැටහීමකි. සාමාන්‍යයෙන් ඉංග්‍රීසියේදී කැපිටල් අක්ෂරයක් පාවිච්චි කිරීමේදී ඒ හඟවන්නා පුද්ගලයෙකු බව තේරුම් කරයි. (උදාහරණයක් ලෙස කැපිටල් J ජෝන් යන්නට යෙදේ.) නමුත් බයිබලයේදී මෙය පිලිබිඹු කරන්නේ බයිබල් පරිවර්තකයේ පොදුවේ ත්‍රිත්ව උගැන්වීම දරන සභාවල අනුග්‍රහය දැරූ කරුණයි - එම නිසා එම සභාවල් තම පරිවර්තන වල එම විශ්වාසය පිළිබිඹු කල යුතුවිය. නමුත් බයිබලයේ මුල් භාෂාවල එවැනි නිශ්චිත වෙනසක් කොහෙත්ම නොතිබුණි.

## (3) "ඔහු" (උන්වහන්සේ) සහ "කවුද"

ශුද්ධාත්මය පුද්ගලයෙකු ලෙස සිතන ඉංග්‍රීසි බයිබලයේ තවත් කාරණයක් නම්, පැරණි සංස්කරණවල ශුද්ධාත්මය හැඟවූ "එය" යන්න, අලුත් සංස්කරණ වලදී (NIV හෝ NKJV) "ඔහු" (උන්වහන්සේ) ලෙස වෙනස් කිරීමයි. (සියලු සිංහල සංස්කරණ වල මෙය ශුද්ධාත්මයාණන්වහන්සේ යනුවෙන් පුද්ගල හැඟීමක් දෙන ලෙස පරිවර්තන කර ඇත. එය ඉංග්‍රීසි සංස්කරණයේ දෝෂය සිංහලයට නැංවීමකි.) ඒහා සමගම බොහෝ නව සංස්කරණවල "ශුද්ධාත්මයන් කුමක්ද" (බලයක්) යන්න "ශුද්ධාත්මය කවුද" (පුද්ගලයෙකු) ලෙස වෙනස් වේ. කැපිටල් S අක්ෂරය මෙන්, මුල් බයිබල් භාෂා මේ වෙනස නොහඳුනයි.

ඉංග්‍රීසි සංස්කරණ වල "ඔහු" හෝ "කවුද" ලෙස පරිවර්තකයන් යෙදූ ග්‍රීක වචන මුල් භාෂාවේ පුද්ගලයෙකු හඳුන්වන්නට අවශ්‍යයෙන්ම යෙදූ ඒවා නොවේ. මෙම වචන "එය" හෝ "කුමක්ද" යනුවෙන්ද පරිවර්තනය කළ හැක. "ඔහු" හෝ "එය" යෙදීමේ තෝරාගැනීම නිශ්චිත විය යුත්තේ දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මය ගැන බයිබල් ඉගැන්වීම් මතය.

## (4) ශුද්ධාත්මය ශෝක කිරීම.

බයිබලයේ විශේෂයෙන් එක් පද කාණ්ඩයක් බොහෝ අය හට දෙවියන්වහන්සේ සහ ශුද්ධාත්මය අසම්බන්ද බැව් යෝජනා කරන අතර, එය ශුද්ධාත්මය "ශෝක කිරීම" ගැන පවසයි. එය පුද්ගලයෙකු නොවේ නම් ශුද්ධාත්මය ශෝකවන්නේ කෙසේදැයි අසනු ලබත්. පළමුවෙන්ම සටහන් කරගත යුතු වන්නේ මෙම පද කාණ්ඩය "ශුද්ධාත්මය" නොව "දෙවියන් වහන්සේගේ ශුද්ධාත්මය" ලෙස පැවසීමයි.

"දෙවියන්වහන්සේගේ ශුද්ධාත්මයානන් වහන්සේට දුක් නොදෙල්ලා" (එපීස 4:30)

මෙය සාමාන්‍ය බයිබල් භාෂාවයි. එවැනිම ප්‍රකාශයක් සලකා බලන්න.

"දානියෙල් වන මා තුළ මාගේ ආත්මය දුක්වුනේය." (දානියෙල් 7:15)

මෙය හඟවන්නේ දානියෙල් සහ ඔහුගේ ආත්මය වෙන්වූ පුද්ගලයන් වූ බැව් නොවේ. එය අපට පවසන්නේ දානියෙල් ඔහුගේ හදවතින් හෝ සිතින් දුක්වූ බැව් පමණි. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේ ආත්මයෙන් දුක් වූ බැව් සම්බන්ධවද, එය සත්‍යයකි.

## (5) <u>එපීසයේ වැඩිමහල්ලෝ</u>

ඔහුගේ ධර්මදූත සංචාර වලදී, අපෝස්තුලුවර පාවුල් ක්‍රිස්තියානි විශ්වාසිකයන්ගේ අලුත් සභා ස්ථාපිත කිරීමට උපකාර විය. විශ්වාසවන්තයන්ගේ කණ්ඩායම් සෑම සංවිධානයටත් සේවයටත් වගකීමට වැඩිමහල්ලන් පත්කරන ලදී. මෙවැනි එක් කණ්ඩායමක් ආමන්ත්‍රණය කරමින් පාවුල් පැවසුවේ :

"දෙවියන්වහන්සේ විසින් තමන්ගේම රුධිරයෙන් මිලේටගත් තමන්ගේ සභාව පෝෂණය කරන්නට ශුද්ධාත්මයාණන්වහන්සේ යම් රැළෙක්හි නුඹලා නායකයන් කොට නියම කළසේකද, ඒ මුලු රැළ ගැනත් නුඹලාම ගැනත් ප්‍රවේසම් වෙයල්ලා" (ක්‍රියා 20:28)

ශුද්ධාත්මය පුද්ගලයෙකු ලෙස මෙම වැඩිමහල්ලන් අධීක්ෂණය කරන්නවුන් ලෙස පත් කලේද? නැතහොත් දෙවියන්වහන්සේගේ බලය - ශුද්ධාත්මය - මෙම වැඩිමහල්ලන් පත්කරන අය මත වුයේද? පිළිතුර සඳහා බයිබලය දෙසට හැරෙන අපට හමුවන්නේ :

"ඔවුහු (පාවුල් සහ බර්නබස්) සභාවක් සභාවක් පාසා ඔවුන්ට වැඩිමහල්ලන් පත්කොට, නිරාහාරයෙන් ඉඳ යාච්ඤා කොට තමුන් අදහාගත් ස්වාමින් වහන්සේට ඔවුන් භාරදී ........." (ක්‍රියා 14:23)

තේරීමේදී දෙවියන්වහන්සේගේ බලය වූ ශුද්ධාත්මයේ උදව්වෙන් පාවුල් විසින්ම ඔවුන් පත්කරන ලදී. නැවත වරක් මෙම අපෝස්තුලුවර පාවුල් ටයිටස්ට ලියුවිට ඔහු උපදෙස් දුන්නේ :

"මා එන විට නුඹ ක්‍රීතියෙහි නැවැත්වූ කාරණය නම්, අඩුව තිබුනු දේවල් නුඹ විසින් පිළිවෙලට යොදන පිණිසත් මා නුඹට ආඥා කල ලෙද නුවරක් පාසා වැඩිමහල්ලන් පත්කරන පිණිසත්ය." (ටයිටස් 1:5)

එමනිසා ශුද්ධාත්මය නමැති දෙවියන්වහන්සේගේ බලයේ උපකාරයෙන් පළමු සභාවේ අපොස්තුලුවරු සහ නායකයන් අධිසෂකයන් පත්කලා මිස, ශුද්ධාත්මය පුද්ගලයෙකු ලෙසින් එය නොකලේය.

ශුද්ධාත්මය පුද්ගලයෙකු ලෙසින් පවසන්නේ යැයි පෙනෙන බයිබල් පදයක තවත් උදාරහණයක් නම් එය අපෝසුතුලුවර පාවුල් අත්අඩංගුවට ගන්නා බැව් අනාවැකි කියූ අවස්ථාවයි.

"බොහෝ දවස් අප එහි නැවතුනු අතර, අගබස් නම් එක් අනාගතවක්තෘ කෙනෙක් යුදයෙන් ඇවිත්, අප වෙත පැමිණ පාවුලගේ ඉග පටිය රැගෙන තමාගේම අත් පා බැඳගෙන : යුදෙව්වරු මේ ඉගපටිය අයිති වූ මනුෂ්‍යයා යෙරුසලමේදී මේ ආකාරයෙන් බැඳ අන්‍යජාතීන්ගේ අත්වලට පාවා දෙන්නේ යැයි ශුද්ධාත්මයාණන් වහන්සේ කියන සේකැයි කීවේය." (ක්‍රියා 21:10-11)

මෙය සිදුවන බැව් පුද්ගලයෙකු වශයෙන් ශුද්ධාත්මය ප්‍රකාශයට පත් කලේද එසේත් නැතිනම් දෙවියන්වහන්සේගේ බලයේ ශුද්ධාත්මය අනාතවක්තෘන්ට මෙය පැවසිමට නුවණ දුන්නේද?

## (6) "දෙවියන්වහන්සේගෙන් එවනලද"

බොහෝ අවස්ථාවල ශුද්ධාත්මය ස්වර්ගයෙන් එවන ලද බැව් බයිබලය පෙන්වයි. ප්‍රොපේතවරු තමන්ගේම වචන කතා නොකල බැව් සහතිකය. ඔහුවු දෙවියන්වහන්සේගේ වචන කතා කලහ. ශුද්ධාත්මය, දෙවියන්වහන්සේගේ වචන ඔවුන්ට දීමට බලය ලෙස ස්වර්ගයෙන් එවන ලදහ. පහත සඳහන් දේ සලකා බලන්න.

"ඔවුන් ඒ දේවල් ගැන සේවය කරන්නේ තමුන්ට නොව නුඹලාට බව ඔවුන්ට එළිදරව් කරන ලද්දේය. ස්වර්ගයෙන් එවන ලද ශුද්ධාත්මයාණන් වහන්සේ කරණ කොටගෙන ශුභාරංචිය නුඹලාට ප්‍රකාශ කළ තැනැත්තන් ලවා දැන් ඒවා දන්වන ලද්දේය." (1පේ‍්‍රතැස් 1:12)

අනාගතවක්තෘන් සුභාරංචි දේශනා කිරීමට ශුද්ධාත්මය ස්වර්ගයෙන් එවන ලද්දේය. දෙවියන් වහන්සේගේ බලය විසින් ඔවුනට දෙවියන් වහන්සේගේ වචන දෙන ලදී.

තමන්වහන්සේ ගැන ප්‍රකාශ කල පරිදි, යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැනත් මෙය සත්‍යයක් විය:

**"ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය. මක්නිසාද දිලිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේප කළ සේක." (ලූක් 4:18)**

යේසුස්වහන්සේ මතවූ දෙවියන්වහන්සේගේ ආත්මය පුද්ගලයෙකු නොවූ අතර, එය තමන්වහන්සේගේ අභිප්‍රාය කරගෙන යාමට සහ යහපත් ක්‍රියා සඳහා පියාණන්වහන්සේගේ දීමනාව විය.

උන්වහන්සේගේ ශුද්ධාත්මය එවන ලද්දේ දෙවියන්වහන්සේය. පැහැදිලිවම යමක් එවන තැනැත්තේ ඒ එවන දෙයට වැඩියෙන් උතුම්ය. දෙවියන්වහන්සේ තමන්වහන්සේගේම ආත්මය පාලනය කරන අතර, උන්වහන්සේ තෝරාගත් අය සඳහා එය දීමනාවක් ලෙස ප්‍රදානය කරන ලදී. "ශුද්ධාත්මයේ ප්‍රදානය" ලෙස බයිබලය සඳහන් කරන්නේද එබැවිනි. (ක්‍රියා 2:38, 10:45, හෙබ්‍රෙව් 2:4)

එම නිසා දිවැස්වරු "ශුද්ධාත්මයන් මෙසේ කියන ලදී" යැයි කී විට, ඔවුන් තම වචනය තමන්ගේ නොවන බැවි තම ශ්‍රාවකයන් හට කී බැවි යන නිගමනයට අප පැමිණේ. අනාගත සිදුවීම් දැන ගැනීම සහ එළිදරව් කිරීම හෝ ප්‍රාතිහාර්යය සිදු කිරීම, පාවුල් ගැන අගබස් ගේ අනාගත වාක්‍යය ඇතුලුව, සිදුවූයේ දෙවියන්වහන්සේගේ බලයෙනි.

## (7) "සැනසිලිකාරයාණන්වහන්සේ"

ශුද්ධාත්මය පුද්ගලයෙකු යැයි බයිබලය පවසනවා සේ පෙනෙන තව එක් අවසන් පදයක් ඇත. යොහන්ගේ සුභාරංචියේ ශුද්ධාත්මය "සැනසිලිකාරයාණන්වහන්සේ" යනුවෙන් යේසුස්වහන්සේ හඳුන්වයි.

**"මම නුඹලා සමග සිටියදීම මේ දේවල් නුඹලාට කීවෙමි. නමුත් මාගේ නාමයෙන් පියාණන්වහන්සේ එවන සැනසිලිකාරයාණන්වහන්සේ, එනම් ශුද්ධාත්මයාණන් වහන්සේ, නුඹලාට සියල්ල උගන්වමින් මා විසින් නුඹලාට කියන ලද සියල්ල නුඹලාට සිහිකරවන සේක." (යොහන් 14:25-26, ශුද්ධ බයිබලය** SINHALA UNION (OLD) VERSION)

පියාණන්වහන්සේ සැනසිලිකාරයාණන් එවනවා යැයි යේසුස්වහන්සේ කී බැවි පළමුවෙන් අපි නිරීක්ෂණය කරමු. මෙය අනෙක් උදාහරණ මෙන් දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ආත්මය හෝ බලය හෝ හුස්ම ලෝකයට එවනවාට සමානය.

දෙවැනුව, සැනසිලිකාරයාණන්ගේ අභිප්‍රාය, උන්වහන්සේ ස්වර්ගයට නැගුනාට පසු යේසුස්වහන්සේගේ ගෝලයන් හට උගැන්වූදේ සිහිකිරීමයි. ඔවුන් හට සිහිකර ගැනිමට උපකාර කළේ කුමක්ද? එය පුද්ගලයෙක්ද, එසේත් නැතිනම්, ඔවුන් සනසන්නට ඔවුන්ගේ ස්වාමියාගේ වදන් සිහිකර ගැනිමට එවූ දෙවියන්වහන්සේගේ බලය වූ ශුද්ධාත්මයද?

ප්‍රායෝගිකව, උන්වහන්සේ මළවුන්ගෙන් උත්ථාන වූවාට පසුව යේසුස්වහන්සේගේ ගෝලයන් හට ලැබුනේ කුමක්ද? එය ආත්මයේ දීමනා විය.

## ශුද්ධාත්මයේ දීමනා

යේසුස්වහන්සේගේ ස්වර්ගාරෝහණයෙන් පසු උන්වහන්සේගේ ගෝලයෝ යෙරුසලමේ රැස්වී සිටියහ.

> **"තද සුලඟක් හමන්නාක් මෙන් ශබ්දයක් අහසෙන් හදිසියෙන් පැමිණ එයින් ඔවුන් හිඳගෙන උන්නාවූ මුලු ගෙය පිරුණේය. ගිනි වැනිවූ දිව් බෙදී යනවා ඔවුන්ට පෙනුණේය. එය ඔවුන් එක් එක්කෙනා කෙරෙහි පිහිටුණේය. ඔවුන් සියල්ලෝ ශුද්ධාත්මයෙන් පූර්ණව, ආත්මයාණන් ඔවුන්ට කතාකරන්නට පුලුවන්කම දුන් ප්‍රකාරයට අන්‍යභාෂා වලින් කතා කරන්නට පටන් ගත්තෝය." (ක්‍රියා 2:2-4)**

යේසුස්වහන්සේගේ පොරොන්දුව ඉටුකර තිබුනි. උන්වහන්සේගේ ගෝලටන් හට ශුද්ධාත්මය දුනි. මෙම අවස්ථාවේදී ඔවුනට නිශ්චිත කුසලතාවයක් දී තිබුනි. එනම් අන්‍යභාෂා වලින් කථා කිරීමය. ශුද්ධාත්මය දානය කළ දවස නම්, රෝම අධිරාජ්‍යය මුලුල්ලේ යුදෙව්වන් පොන්තකෝස්ත දිනය සැමරීමට යෙරුසලමට පැමිණි දිනයයි.

> **"ඔවුන් සියල්ලෝ විස්මිතව පුදුම වී : බලව, මේ කතා කරන සියල්ලෝ ගලීලයෝ නොවෙද්ද? අප උපන් දේශවල අප එකිනෙකාගේම භාෂාවෙන් ඔවුන් කතා කරනවා කෙසේ අසමුද?" (ක්‍රියා 2:7-8)**

ශුද්ධාත්මය, දෙවියන්වහන්සේගේ බලය, නියමිත වේලාවටම අන්‍ය භාෂා වලින් කථා කිරීමේ ප්‍රාතිහාර්යමය බලය ඔවුන්ට දුන්සේක. නැගිටවනු ලැබූ ක්‍රිස්තුස්වහන්සේ ගැන ගෝලයන්ට ප්‍රකාශ කිරීමට තිබූ සුභාරංචිය ලෝකයේ සැමදෙසින්ම ආ ජනතාවට ශ්‍රවණය කිරීමට හැකි විය.

ගෝලයන්ට තවත් හැකියාවන් දෙන ලදී. අපෝස්තුලුවර පාවුල් කොරින්තිවරුන් හට ලියන විට තවත් දීමනා ගණනාවන් ගැන සඳහන් කරයි.

"ඉතින් නානා ප්‍රකාර දීමනා ඇත්තේය. නමුත් එක ආත්මයාණන් වහන්සේය. නානා ප්‍රකාර සේවය කිරීම් ඇත්තේය. නමුත් එක ස්වාමීන්වහන්සේය. නානා ප්‍රකාර ක්‍රියා කිරීම් ඇත්තේය. නමුත් සියල්ලන් තුළෙහි සියල්ල කරවන්නේ එක දෙවියන්වහන්සේය. නමුත් ආත්මයාණන් වහන්සේගේ ප්‍රකාශ වීම එකිනෙකාට දී තිබෙන්නේ ප්‍රයෝජනය පිණිසය. කෙසේද යත් : ආත්මයාණන් වහන්සේ කරනකොටගෙන එක්කෙනෙකුට ප්‍රඥාවේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ කරණකොටගෙන තවත් කෙනෙකුට දැන ගැනීමේ වචනයද, එම ආත්මයාණන්වහන්සේ තුළ වෙන කෙනෙකුට ඇදහිල්ලද, එම ආත්මයාණන්වහන්සේ තුළ තවත් කෙනෙකුට සුව කිරීමේ දීමනාවද, තවත් කෙනෙකුට ආත්මවල් විමසීමද, තවත් කෙනෙකුට නානා වර්ග භාෂාද, තවත් කෙනෙකුට භාෂා තේරුම් කර දීමද දෙන ලද්දේය. නමුත් ඒ එකම වූ ආත්මයාණන්වහන්සේ තමන් කැමති ලෙස එකිනෙකාට වෙන වෙනම බෙදා දෙමින්, මේ සියල්ලු කරවන සේක." (1 කොරින්ති 12:4-11)

ශුද්ධාත්මයේ බලය වූ දෙවියන්වහන්සේගේ දීමනාව නානා විධි හැකියාවන් පෙන්විය. ශුද්ධාත්මය ඇත්ත වශයෙන්ම බලය විය. සුභාරංචිය තුළින් මිනිස් වර්ගයා දෙවියන්වහන්සේ දෙසට ගන්නටත්, විශ්වාසය තුළ පළමු සභාව ශක්තිමත් කිරීමටත් යොදාගත යුතු බලයක් විය. ඔහුගේ තවත් ලිපියක පාවුල් ඒ ගැන පවසයි.

> "ඉදින් ශුද්ධාත්මයානන්වහන්සේගේ බලයෙන් නුඹලා අධික බලාපොරොත්තුවෙන් යුක්තව සිටින පිණිස, බලාපොරොත්තුවේ දෙවියන්වහන්සේ ඇදහිල්ලෙන් වූ සියලු ප්‍රීතියෙන්ද සමාදානයෙන්ද නුඹලා පූර්ණ කරන සේක්වා." (රෝම 15:13)

ශුද්ධාත්මය සැනසිලිකාරයාණන් ලෙස යේසුස් වහන්සේ හැඳින්වූයේ ඇයිදැයි අපට පෙනේ. පාවුල් දේශනා කළ පරිදි, එය අනාගතයේ වඩා හොඳ ජීවිතයක් සහ දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ජීවිතයක් සඳහා බලාපොරොත්තුව වර්ධනය කළේය. (ක්‍රියා 28:30-31)

ශුද්ධාත්මය, යේසුස්වහන්සේගේ අපෝස්තුලුවරුන් දේශනා කල සත්‍යයට සැනසිලිකරුවෙක් සහ සාක්ෂියක් විය. දෙවියන්වහන්සේ ඔවුන් සමඟ සිටි බැව් සනාථ කිරීම සඳහා විවිධ ප්‍රාතිහාර්ය පෙන්වීමට ඔවුන් හට දුන් බලය විය. පළමු වන සියවසේ ක්‍රිස්තියානි දහමේ සීඝ්‍ර ව්‍යාප්තියට මෙය එක් හේතුවක් විය. ඉහත උද්ධෘතයට පද කිහිපයකට පසු පහත සඳහන් ලෙස මේ ගැනත් පාවුල කතා කලේය:

> "දෙවියන්වහන්සේට අදාල කාරණා ගැන ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ මාගේ පාරට්ටු කර ගැනීමක් තිබේ...... ලකුණු වල සහ පුදුම වලත්

බලයෙන්ද ශුද්ධාත්මයාණන්ගේ බලයෙන්ද....... යෙරුසලම පටන් ඉල්ලූරිකය දක්වා අවට රටවල ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය සම්පූර්ණ වශයෙන් දේශනා කළෙමි." (රෝම 15:17-19)

ඔවුනට ප්‍රදානය කරන ලද සුභාරංචිය ශ්‍රවණය කල මනුෂ්‍ය වර්ගයා ගැලවීම වන උන්වහන්සේගේ අභිප්‍රාය ඉටුකර ගැනිමට දෙවියන්වහන්සේ ශුද්ධාත්මය යොදාගනිමින් සිටියහ.

"මාගේ මුඛයෙන් නික්මෙන මාගේ වචනයත් මා වෙතට හිස්ව හැරී නැවිත්, මා කැමති දෙය සිද්ධකොට මා නියම කළ කාරණය සඵලකරනවා ඇත." (යෙසායා 55:11)

මෙම ශුද්ධාත්මය පුද්ගලයෙක්විද? නැත. එය එදත්, අදත් පෘථිවිය තුළ උන්වහන්සේගේ අභිප්‍රාය ඉෂ්ට කිරිමට යොදාගන්නා දෙවියන්වහන්සේගේ බලය වේ.

## ශුද්ධාත්මය ඇති බව පමණක් ගැලවීමේ සහතිකයක්ද?

සමහර ක්‍රිස්තියානි කණ්ඩායම්, ශුද්ධාත්මය අයත් කර ගැනිම පුද්ගලයෙකු හෝ පුද්ගල සමාජයක් සියලු සත්‍ය දෙසට රැගෙන යන බවත්, බයිබලය කියැවීම සහ අධ්‍යයනය ද්විතිය බවත් උගන්වත්.

මෙය සත්‍යයක්ද? ශුද්ධාත්මයේ දීමනාවක් ලැබීම යමෙක් ගැලවීම ලැබීමේ සහතිකයක් බැව් බයිබලය ප්‍රකාශකරත්ද?

මෙහි විරුද්ධය සත්‍යයක්ය. දෙවියන්වහන්සේගේ දීමනා සහ බලයයන් ලද අය දේව මාර්ගයෙන් ඉවතට හැලි ගොස් පසුතැවීමට මගක් සොයාගත නොහැකිව සිටීමට ඉඩකඩ ඇති බව බයිබලය නිශ්චිතව පවසත්.

"මක්නිසාද වරක් ආලෝක කරනු ලැබුවාවූ, ස්වර්ගීය දීමනාවේ රසය වින්දාවූ, ශුද්ධාත්මයාණන්වහන්සේට පංගුකාරයන්වූ, දෙවියන්වහන්ගේ යහපත් වචනයේද මතු පැමිණෙන කාලයේ බලවලද රසය බැලුවාවූ තැනැත්තන්, වැටී ගිය කල්හි ඔවුන් නැවත පසුතැවිල්ලට පමුණුවන්ට නුපුලුවන: මක්නිසාද ඔව්හු දෙවියන් වහන්සේගේ පුත්‍රයා තමුන්ටම දෙවනු කුරුසියෙහි ඇණගසා නින්දාවට පමුනුවති." (හෙබ්‍රෙව් 6:4-6)

මේවා බරපතල සහ සිහිබුද්ධියෙන් යුතු වචන වේ. ශුද්ධාත්මයේ දීමනාව ක්‍රිස්තියානිකාරයෙකු ස්වයංක්‍රියව දෙවියන්වහන්සේගේ මාර්ගය දෙසට රැගෙන නොයන අතර ඔවුන් සත්‍යයේ මාර්ගයේ රඳා නොපවත්වයි.

දෙවියන්වහන්සේගේ ආත්මික දීමනා උපරිම යහපතට නොයොදා සහ ඇත්තවශයෙන්ම ඒවා අනිසිලෙස පාවිච්චි කළ එක් කණ්ඩායමක් හට අපෝස්තුලුවර පාවුල් ලිව්ය (1 කොරින්ති 14:12-19) ශුද්ධාත්මයේ දීමනාව හැරෙන්නට, අදහන්නෙකු හරි මාර්ගයේ පිහිටුවීමට උපකාරිවීම සඳහා තවත් යමක් තිබිය යුතුය.

## ගැලවීම ලැබීමට අප කුමක් කල යුතුද?

අපෝස්තුලුවර පාවුල් සහ ඔහුගේ ගමන් සහායකයා සිලස්, ඔවුන්ගේ ධර්මදූත ගමන් වලදී දේශනාකල යම් යුදෙව්වන් කිහිපදෙනෙකු විය. මෙම යුදෙව්වන්, යුදෙව් ශුද්ධ ලියවිලි වූ බයිබලයේ පැරණි ගිවිසුම ගැන හොඳින් දැන සිටියහ.

පාවුල් ඔවුන් හට දේශනා කල සුභාරංචිය අතීතයේ ඔවුන් තේරුම්ගත් දේට වඩා වෙනස් යමක් විය. කෙසේ නමුත්, පාවුල් මෙන්ම ඔවුන්ද යුදෙව්වන් වූ නිසා, ඔවුන් එකම ශුද්ධ ලියවිලි පාවිච්චි කලහ. යුදෙව්වන් සොයන මෙසායා නසරෙත්හි යේසුස් යැයි ඔප්පු කිරීමට පාවුල් පැරණි ගිවිසුම යොදා ගත්හ.

මෙම යුදෙව්වෝ බෙරියා නම් නගරයේ වාසය කළෝය. තෙසලෝනිකයේ යුදෙව්වෝ ඔහු ප්‍රතික්ෂේප කර, තම ජිවිතය උදෙසා රාත්‍රියේ පලා යැමට බල කරන ලද විට පාවුල් එහි සැපත් විය.

> **"එවලේම සහෝදරයෝ රාත්‍රියේ පාවුල් සහ සීලස් බෙරියයට ඇරියෝය. ඔවුහු එහි පැමිණ යුදෙව්වරුන්ගේ සිනගෝගයට ඇතුල්වූවෝය. ඔවුහු තෙසලෝනිකයෙහි අයවලුන්ට වඩා උතුම් වූවෝය. මක්නිසාද ඔවුහු මේ කාරණා මෙසේ දැයි දැනගන්නා පිණිස දවස් පතා ලියවිලි සොයමින්, සිතේ මුලු කැමැත්තෙන් වචනය පිළිගත්තේය. එහෙයින් ඔවුන්ගෙන් බොහෝ දෙනෙක්ද ග්‍රීක කුල ස්ත්‍රීන් හා පුරුෂයන් ගෙන් කීප දෙනෙක්ද අදහාගත්තෝය." (ක්‍රියා 17:10-12)**

සුභාරංචිය තුළ අදහන්නන් ලෙස මෙම මිනිසුන් සහ ස්ත්‍රීන්ගේ ජිවිත වෙනස් කලේ කුමක්දැයි සලකා බලන්න. එය පාවුල් සහ සිලස්ගේ දේශනා වූ අතර එය අනුසරණය වූයේ පවසන ලද දේ ස්ථිර කිරීමට බයිබලය පිරික්සීමෙනි.

ශුද්ධාත්මය අයත්කර ගැනීම කිසිවෙකුට ගැලවීමේ හැකියාව ලබා නොදුනි. එය ඔවුන්ගේ සියලු දේශනා වලදී අපෝස්තුලුවරු ක්‍රියාකල ආකාරයට (ක්‍රියා 2:38,41 , 9:18, 10:47-48, 16:15-33, 18:8, 19:5, 22:16) දෙවියන් වහන්සේගේ රාජ්‍යයේ සුභාරංචිය තුළ විශ්වාසය (ක්‍රියා 19:8, 28:23)

සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අණකල පරිදි බෞතිස්මය ලැබීමත් (මාර්ක් 16:15-16) විය.

## අවසානය

ශුද්ධාත්මය යනු මනුෂ්‍යය වර්ගයා සමඟ උන්වහන්සේ තම අභිප්‍රාය ඉෂ්ඨකර ගන්නා බලය වූ දෙවියන්වහන්සේගේම හුස්ම වේ. උන්වහන්සේගේ පුත්‍රයා වූ, ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ප්‍රාතිහාර්යමය උපත ඇතුලුව එය බොහෝ විශේෂිත දේවලට සම්බන්ධය.

උන්වහන්සේගේ වචනය ලියූ සහ ප්‍රකාශ කල දිවැස්වරුන් සහ අපෝස්තුලුවරුන් ඇතුලුව බොහෝ පුරාණ මිනිසුන්හට, ශුද්ධාත්මය විශේෂිත දීමනාවක් වශයෙන් දෙවියන්වහන්සේ දුන්සේක. මේ සියල්ලටම වඩා උතුම්ව, උන්වහන්සේම කී පරිදි දෙවියන්වහන්සේගේ ආත්මයෙන් බොහෝ අය සුව කල යේසුස්වහන්සේට ශුද්ධාත්මය දානය කරන ලදී. (මතෙව් 12:28 බලන්න.)

පළමුවෙනි සියවසෙහි අදහන්නන්ට ශුද්ධාත්මය දෙනු ලැබුවද, එය ඔවුන් ගැලවීම ලබන බව සහතිකයක් නොවිය. ඒ වෙනුවට ක්‍රිස්තියානිකාරයන් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ සුභාරංචිය සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමය තේරුම් ගැනිම සහ විශ්වාස කිරීමත්, පාප වලට මනස්තාපවී ජලයෙහි බෞතිස්මය ලැබීමත් අවශ්‍ය විය.

කරුණාකර ඔබම බයිබලය කියවන්න. මේවා මෙලෙසදැයි සොයා බලන්න.

- මයික් බූල් -

## ප්‍රශ්න

1. "ආත්මය" යන්නෙහි මුල් අර්ථය කුමක්ද?

2. එම වචනයෙහිම අනෙකුත් තේරුම් මොනවාද?

3. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ආත්මය පාවිච්චි කරන උදාරහණ තුනක් දෙන්න.

4. ශුද්ධාත්මය සමග ක්‍රිස්තුස්වහන්සේ ක්‍රියාකරන උදාරහණයක් දෙන්න.

5. දෙවියන්වහන්සේගේ ආත්මය ආමන්ත්‍රණය කල හැකිකේ "උන්වහන්සේ" හෝ "එය" ලෙසින්ද?

6. එපීස 4:30 විස්තර කරන්න.

7. සැනසිලිදායකයාණෝ කුමක්විද?

8. ශුද්ධාත්මය ගැලවීම සහතික කරන්නේද?

9. ඉහත ඔබගේ පිළිතුර සනාථ කිරීමට පද සපයන්න.

10. ශුද්ධාත්මයට බයිබලයෙහි සබඳතාවය කුමක්ද?